# බළන්ගොඩ නගර සභාව.
# ටෙන්ඩර් දැන්වීමයි

2010 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මාළු කඩ,එළවළු කඩ හා සිල්ලර කඩ බදු දීම.

වර්ෂ 2009 ක්වූ ඔක්තෝබර් මස 13 වන අඟහරුවාදා දින දිනමිණ පුවත්පතෙහි පිටු අංක 02 හා පිටු අංක 20 හි බළන්ගොඩ නගර සභාව විසින් පලකරන ලද 2010 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මාළු කඩ, එළවළු කඩ හා සිල්ලර කඩ බදු දීම පිළිබඳ ටෙන්ඩරය, 2009 ඔක්තෝබර් මස 20 වන දින බළන්ගොඩ නගර සභාවේ පැවති විශේෂ මහ සභාවේදී ගත් තීරණය පරිදි අවලංගු කරනු ලබන බවත්, පහත උපලේඛනයේ විස්තර කරනු ලබන කඩ කාමරය පමණක් 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමට තීරණයකර ඇති බවත් මෙයින් දන්වනු ලැබේ.

2010 ජනවාරි මස 01 වන දින සිට 2010 දෙසැම්බර් මස 31 දින දක්වා කාලයට පොදු වෙළඳසැලෙහි අංක 08 දරණ කඩය බදු දීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් මිළ ගණන් නගර සභාවේ සභාපති වන මා විසින් වර්ෂ 2009 නොවැම්බර් මස 26 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ.

02. ටෙන්ඩර් විවෘත කිරීම 2009 නොවැම්බර් මස 26 වන දින පෙ.ව.11.00 ට මෙම කාර්යාලයේ දී සිදුකරන අතර , මෙම අවස්ථාවට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය

03. 2009 නොවැම්බර් මස 25 වන දින ප.ව.03.00 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන අතර , වැඩි විස්තර නගර සභා කාර්යාලයෙන් ලබාගත හැකි වේ. කාර්යාලයේ දුරකථන අංකය : 045-2287275 වේ. බදුදීමට නියමිත පොදු වෙළඳසැල කඩය පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත.

## උපලේඛනය

| ටෙන්ඩර්දමනු ලබන කඩ කාමරය පිළිබඳ විස්තර | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු ( වැට් හා ජා.ගො.බ. සහිතව) | අවම වාර්ෂික ලංසුව |
|---|---|---|---|
| පොදු වෙළඳසැල අංක 08 දරණ කඩ කාමරය | රු. 2500.00 | රු. 577.00 | රු. 48000.00 |

- අවම ලංසුවට අමතරව රජයේ අනුමත බදු මුදල් ද ගෙවිය යුතුය.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

2009.10.23 වන දින
බළන්ගොඩ නගර සභාවේදීය.